# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1905/6 - 2015 මාර්තු මස 09 වැනි සඳුදා - 2015.03.09**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

1994 අංක 01 දරන වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය

**1994 අංක 01 දරන වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තියේ 18 - 2(ඇ) වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග**

නිතීඥ ජේ.පී.දයාසිරි පද්මකුමාර ජයසේකර,
වයඹ පළාත් ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
නිතීය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලනය,
මානව සම්පත්, අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු,
ඉඩම්, පරිසර, සංචාරක හා ආයෝජන සම්බන්ධීකරණ,
සමුපකාර, සංවර්ධන සහ ආහාර සැපයුම් හා බෙදා හැරීම් අමාත්‍ය.

2015 පෙබරවාරි මස 27 දින
කුරුණෑගල,
ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

*නියෝග*

01**.** මෙම නියෝග 2014 අංක 01 දරන වයඹ මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය පිළිබඳ නියෝග වශයෙන් හඳුන්වනු ලැබේ.

*1 වැනි කොටස*

**ඉරිදා සහ පුර පසළොස්වක පොහොය දිනයන්හි උපකාරක පන්ති පැවැත්වීම**

02. කිසිම තැනැත්තෙකු විසින් වයඹ පළාත තුල ඉරිදා දිනයන්හි පෙ.ව. 6.00 සිට ප.ව. 1.30 දක්වා කාල සීමාව තුල, 1 ශ්‍රේණියේ සිට 11 ශ්‍රේණිය දක්වා (අ.පො.ස සාමාන්‍ය පෙළ දක්වා) වන පාසැල් සිසුන් සඳහා උපකාරක පන්ති පැවැත්වීම නොකල යුතු අතර, පුර පසළොස්වක පොහොය දිනයන්හි ඕනෑම ආකාරයක පන්ති පැවැත්වීම නොකල යුතුය.

1A - PG 2390 — 05 (2015/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*2 වැනි කොටස*

**ආයතන අධීක්ෂණය කිරීම**

03. යම් ආයතනයක් පරීක්ෂා කිරීමට හෝ යම් ආයතනයක් පිළිබඳ තොරතුරු ලබා ගැනීමට හෝ මානව සම්පත් සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියෙකුට බලය ඇත.

04. මානව සම්පත් සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාට හෝ සභාපතිවරයා විසින් බලය පවරන ලද නිලධාරියෙකුට තම සහායක නිලධාරින්ද සමග ආයතන ක්‍රියාත්මක වේලාවන් තුලදී ආයතනය තුළට ඇතුල්වීමටත්, අවශ්‍ය තොරතුරු ලබා ගැනීමටත් බලතල ඇත.

05. අවශ්‍ය තොරතුරු ලබා දීම හා අවශ්‍ය විය හැකි අනෙකුත් සහයෝගයන් ලබා දීම ආයතනයේ පාලක පක්ෂයේ / කළමණාකරුගේ වගකීම විය යුතුය.

06. සභාපතිවරයා විසින් වයඹ මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය පිළිබඳ නියෝග සම්බන්ධයෙන් වූ, ස්වකීය බලතල, සාමාන්‍යාධිකාරවරයා වෙත පවරා දිය හැකිය.

*3 වැනි කොටස*

බලපත්‍ර අවලංගු කිරීම

07. යම් ආයතනයක් විසින් මෙම නිවේදනයේ 2 වැනි වගන්තියේ දැක්වෙන කොන්දේසි කඩකර ඇති බව සභාපතිවරයාගේ මතය වනවිට වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තියේ 18 - 2 (ඇ) වගන්තිය යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කිරීමේ නියෝගයක් නිකුත් නොකිරීමට හේතු ඇත්නම් සති තුනක් ඇතුලත දන්වන ලෙස බලපත්‍රධාරියාට ලියාපදිංචි තැපෑලෙන් දැන්වීමක් යැවිය යුතුය.

08. සති තුනක් ඇතුලත එම ලිපියට පිළිතුරක් එවනු නොලැබුව හොත් හෝ එවනු ලැබූ පිළිතුර සම්බන්ධයෙන් සෑහීමකට පත්විය නොහැකිවූ විට ඉහත 07 වගන්තියේ සඳහන් බලපත්‍රය අවලංගු කිරීමේ නියෝගයක් නිකුත් කිරීමට සභාපතිවරයාට බලය ඇත්තේය.

*4 වැනි කොටස*

**අභියාචනා**

09. බලපත්‍රයක් අවලංගු කිරීම සම්බන්ධයෙන් හෝ බලපත්‍රයක් අලුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් අතෘප්තියට පත් තැනැත්තෙකුට අමාත්‍යවරයාට අභියාචනයක් ඉදිරිපත් කල හැකිය.

10. එබඳු අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් උපදේශක මණ්ඩලයේ සාමාජිකයන් තිදෙනෙකුට නොවැඩි මණ්ඩලයක් මගින් පරීක්ෂණයක් පවත්වා ලබා ගන්නා නිර්දේශයන් මත තීරණයක් දිය යුතුය.

11. තමාගේ අභියාචනයක් සම්බන්ධයෙන් පෞද්ගලිකව හෝ නියෝජිතයෙකු මගින් කරුණු නියෝජනය කිරීමේ අවස්ථාවක් ඉල්ලුම්කරුට තිබිය යුතුය.

12. අභියාචනයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය.

*5 වැනි කොටස*

**උපදේශක කමිටුව**

13. 2012 ඔක්තෝබර් 15 වැනි සඳුදා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1780/4 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ IV(අ) වැනි කොටසේ පළාත් සභා නිවේදන යටතේ වයඹ පළාත් සභාව විසින් 1994 අංක 01 දරන වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තියේ 18 - 2 (ඇ) වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග යටතේ අමාත්‍යවරයා විසින් පත් කරන ලද උපදේශක කමිටුව අදාළ වේ.

*6 වැනි කොටස*

**පරිපාලන කටයුතු**

14. 2012 ඔක්තෝබර් 15 වැනි සඳුදා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1780/4 දරන *අති විශෙෂ ගැසට්* නිවේදනයේ IV (අ) වැනි කොටසේ පළාත් සභා නිවේදන යටතේ වයඹ පළාත් සභාව විසින් 1994 අංක 01 දරන වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තියේ 18 - 2 (ඇ) වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග යටතේ ආයතන ලියාපදිංචිය, පරිපාලනය හා උපදේශ සේවා සැපයීමේ කටයුතු සඳහා අධිකාරිය විසින් පිහිටුවන ලද විශේෂ පරිපාලන ඒකකය මෙහිදී අදාළ වේ.

*7 වැනි කොටස*

වැරදි සහ දඬුවම්

15. මෙම නිවේදනයේ නියෝග යටතේ 02 වගන්තියේ සඳහන් නියෝග කඩ කිරීම

16. බලපත්‍රයක් ලබා ගෙන ඇති ආයතනයක්, සභාපතිවරයා විසින් මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණය පිළිබඳ නියෝග යටතේ නිකුත් කරනු ලබන උපදෙස් වලට අනුකූල නොවීම.

17. බලපත්‍රයක් ලබා ගෙන ඇති ආයතනයක්, සභාපතිවරයා විසින් පවරන ලද බලය මත ක්‍රියාකරන නිලධාරියෙකුට, අවශ්‍ය තොරතුරු සහ අදාළ සහයෝගය ලබා නොදීම.

18. මෙම රෙගුලාසි යටතේ වරදක් වශයෙන් දක්වා ඇති කිසියම් කාර්යයක් කිරීම හෝ නිවේදනයෙන් දැක්වෙන කාර්යයන් නොකර හැරීම සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවරිය හැකිය. වරදකරු වූ විට අවුරුද්දක් දක්වා සිර දඬුවමක් හෝ රුපියල් පනස්දහසක් දක්වා වූ දඩයක් හෝ දෙයාකාරයෙන් එක් ආකාරයක දණ්ඩනයකට හෝ එකී දණ්ඩනයන් දෙකටම හෝ යටත් කල යුතු වන්නේය.

19. මෙම නියෝග වල කාර්යය සඳහා ඃ

"අමාත්‍යවරයා" යන්නෙන්, වයඹ පළාතේ මානව සම්පත් සංවර්ධන විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.
"අධිකාරිය" යන්නෙන්, වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය අදහස් වේ.
"අධ්‍යක්ෂ මණ්ඩලය" යන්නෙන්, වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කෙරේ.
"සභාපතිවරයා" යන්නෙන්, වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා අදහස් කෙරේ.
"විධායක අධ්‍යක්ෂවරයා" යන්නෙන්, වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරියේ විධායක අධ්‍යක්ෂවරයා අදහස් කෙරේ.
"සාමාන්‍යාධිකාරීවරයා" යන්නෙන්, වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා අදහස් කෙරේ.
"ආයතන" යන්නෙන්, වයඹ පළාතේ මානව සම්පත් සංවර්ධනයට අදාළ වන කටයුත්තක් සිදු කරනු ලබන ශිෂ්‍යයන් 10 කට වැඩි සංඛ්‍යාවක් සිටින ආයතනයක් අදහස් කෙරේ.
"ප්‍රඥප්තිය" යන්නෙන්, 1994 අංක 01 දරන වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය අදහස් වේ.
"උපදේශනය" යන්නෙන්, වයඹ මානව සම්පත් සංවර්ධනය හා කළමනාකරණයේ යෙදෙන ආයතන වැඩි දියුණු කිරීම සඳහා උපදේශනයන් සැපයීම හා ඊට ආනුශංගික සේවා සැපයීම අදහස් කෙරේ.
"උපදේශක කමිටුව" යන්නෙන්, 2012 ඔක්තෝබර් 15 වැනි සඳුදා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1780/4 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* IV (අ) වැනි කොටසේ පළාත් සභා නිවේදන යටතේ වයඹ පළාත් සභාව විසින් 1994 අංක 01 දරන වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තියේ 18 - 2 (ඇ) වගන්තිය යටතේ "අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග යටතේ 5 වෙනි කොටසේ අමාත්‍යවරයා විසින් පත්කරන ලද උපදේශක කමිටුව අදාළ වේ.
"බලපත්‍රය" යන්නෙන්, 2012 ඔක්තෝබර් 15 වැනි සඳුදා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1780/4 දරන *අති විශෙෂ ගැසට් නිවේදනයේ* IV (අ) වැනි කොටසේ පළාත් සභා නිවේදන යටතේ වයඹ පළාත් සභාව විසින් 1994 අංක 01 දරන වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තියේ 18 - 2 (ඇ) වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග යටතේ නිකුත් කරන ලද බලපත්‍රය අදහස් කෙරේ.

මෙම *ගැසට් පත්‍රයේ* සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පාඨවල යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨ බල පැවැත් වේ.

03 - 662

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.